දූෂණ අවධානම තක්සේරු කිරීම

ආයතනය - ප්‍රධාන අමාත්‍යාංශය, දකුනු පළාත

තක්සේරු සිදු කල දිනය -2026-09-14

| අනු අංකය | අවධානම | එය සිදු වීමට කොතරම් ඉඩ තිබේද අඩු,මධ්‍යම,ඉහළ වශයෙන් 1 සිට 5 දක්වා ලකුණු දෙන්න | එය සිදුවුවහොත් සිදු විය හැකි හානිය අඩු මධ්‍යම ඉහළ වශයෙන් 1 සිට 5 දක්වා ලකුණු ලබා දෙන්න | පවත්නා ආරක්ෂක විධිවිධාන මොනවාද | පවත්නා ආරක්ෂක විධිවිධාන කොතරම් ඵලදායිද ඵලදායක/ මධ්‍යස්ථ/ ඵලදායක නැත | කුමන අමතර ආරක්ෂක විධිවිධාන අවශ්‍යද |
|---|---|---|---|---|---|---|
| අංශය /ඒකකය /ක්ෂේත්‍රය - පාලන අංශය | | | | | | |
| | | | | | | |
| 1 | වාහන නඩත්තු කටයුතු වලදී නියමිත පරිදි දක්වා ඇති සියලු කාර්යයන් සම්පූර්ණ නොකර ගෙවීම් කටයුතු සඳහා ඉල්ලීම් ඉදිරිපත් කිරීම. | 2 | 4 | අදාල ආයතනය වෙතින් වගකීම් කාලයක් ලබාගැනීම. වාහන සඳහා පෙර හා පසු කාර්මික වාර්තා ලබාගැනීම. වාහන නඩත්තු පරිගණක පද්ධතිය හරහා සමාන නඩත්තු ඉල්ලීම් අධීක්ෂණය කිරීම. | ඵලදායි | scan report ලබාගැනිම. |
| 2 | සංචිත වාහන විධිමත් අනුමැතියකින් තොරව රැගෙන යාම සහ ධාවන සටහන් පොත් වල ගමන් කල දුර වේලාව දෝෂ සහගතව සටහන් කිරීම. | 3 | 4 | ආරක්ෂක සේවාව හරහා වාහන ඇතුල්වීම හා පිටවීම සම්බන්ධව ලේඛණ පවත්වාගෙන යාම. රාත්‍රි වාහන ගාල් කල පසු හා නිවාඩු දිනවල වාහන ලබා ගැනිමට පූර්ව අවසරය ආරක්ෂක අංශ දැනුවත් කර ලබා දී තිබිය යුතු වීම. වාහන ඉල්ලීම් දිස්ත්‍රික්කයෙන් පිටතට අමාත්‍යාංශයේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරි හරහා ලේකම් අනුමැතිය ලද පසු පමණක් වෙන් කර ගත හැකි ලෙස ආකෘතිපත්‍ර හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම. | ඵලදායි | GPS තාක්ෂණය භාවිතා කිරීම.අභ්‍යන්තර විගණන හරහා මාසිකව විගණනය කිරීම. |
| 3 | නියමිත ප්‍රමාණයට වඩා ඉන්ධන අයථා ලෙස භාවිතා කිරීම. | 4 | 4 | වාර්ෂිකව ඉන්ධන පරීක්ෂා සිදු කිරීම. යොදවන රාජකාරිය අනුව ඉන්ධන ලබා දීම. ධාවනය කළ කිලෝමීටර් ගණනට සාපේක්ෂව ඉන්ධන පරිභෝජනය මාසිකව සසඳා බැලීම. | ඵලදායි | ඉන්ධන ටැංකියට සංවේදක භාවිතා කිරීම. |
| 4 | අනවශ්‍ය ලෙස අතිකාල සේවයේ යෙදීම සඳහා ඉල්ලීම ඉදිරිපත් වීම. | 3 | 4 | අංශ ප්‍රධානි නිර්දේශ සහිතව සිදු කළ යුතු රාජකාරි සම්බන්ධව ලේකම් වෙතින් පූර්ව අනුමැතිය ලබා ගත යුතු වීම. අදාල කාර්ය සිදු කල බවට අංශ ප්‍රධාන මාණ්ඩලික නිලධාරි තහවුරුව ලද විට පමණක් ගෙවීම් සිදු කිරීම. | ඵලදායි | වැඩ අධ්‍යයනය සිදුකිරීම හා රාජකාරි ප්‍රමාණයේ විෂමතාවක් පවතීනම් සුදුසු පරිදි සමානව වැඩ බෙදීම. |
| | | | | | | |
| අංශය /ඒකකය /ක්ෂේත්‍රය - ගිණුම් අංශය | | | | | | |
| | | | | | | |
| 1 | ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී භාණ්ඩ හා සේවා නියමිත ප්‍රමිතියෙන් තොරව ලබා ගැනීම. | 1 | 5 | තාක්ෂණික ඇගයිම් කමිටු නිර්දේශ ලබා ගැනීම. ප්‍ර.ලේ (ඉංජිනේරුසේවා)වෙතින් හා සුළු ගෙවීම් සඳහා තාක්ෂණික නිලධාරි පරීක්ෂා කර නිර්දේශ ලබා දීමෙන් පසු පමණක් ගෙවීම් කිරීම. සියලුම ටෙන්ඩර් කැඳවීම හා තෝරාගැනීම් මාර්ගගතව ප්‍රසිද්ධ කිරීම. | ඵලදායි | විනිවිදභාවය වැඩිකිරීමට e-ප්‍රසම්පාදන ක්‍රමය හඳුන්වා දීම. |
| 2 | ගෙවීම් කටයුතු වලදි දෝෂ සහගතව වැරදි ගෙවීම් සිදු විම. | 1 | 5 | ද්විත්ව අත්සන් ක්‍රමය යොදා ගැනීම. ආදායකයාගේ ගිණුමට පමණයි ලෙස රේඛනය කර චෙක්පත් මගින් පමණක් ගෙවීම. චෙක්පත් සේප්පුගත කිරීම. | ඉතා ඵලදායි | - |
| 3 | ඉන්වෙන්ට්‍රි ගත කළ භාණ්ඩ පුද්ගලික භාවිතයට ගැනීම. | 1 | 4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම. ඉන්වෙන්ට්‍රි ලියාපදිංචි ලේඛන පවත්වාගෙන යාම. භාණ්ඩ ඉවතට ගෙන යාමේදී ආරක්ෂක අංශ හරහා පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව රැගෙන යා නොහැකි වීම. | ඵලදායි | Barcord සහිත ඉන්වෙන්ට්‍රි පද්ධතියක් ආරම්භ කිරීම. ඉන්වෙන්ට්‍රි ලේඛන පොදු ලේඛන ලෙස පරීක්ෂාවට Sharefolder හි ඇතුළත් කිරීම. |

DRAFT

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 4 | ගබඩාවේ උපකරණ අවභාවිතය වීම. | 3 | 4 | ගබඩා කළමනාකරණ දත්ත පද්ධතිය සකසා තිබීම හරහා අවභාවිත අවධානම ඉතා අඩු කර ඇත.<br>මාසිකව තුලනය කිරීම. | එලදායි | මාස 3 කට වරක් භෞතිකතොග පරීක්ෂාව සිදු කිරීම.වාර්ෂිකව අභයන්තර විගණනය මඟින් විගණනය කිරීම. |
| 5 | ප්‍රසම්පදනයේදී අඩුම මිල හෝ හොඳම ප්‍රමිතිය ඇති සැපයුම්කරුවන් අසාධාරන ලෙස ප්‍රතික්ෂේප කිරීම. | 2 | 5 | ස්වාධින තාක්ෂණික කමිටු හරහා පිරිවිතර සැකසීම.<br>තාක්ෂණික කමිටුව මඟින් පරීක්ෂා කර භාණ්ඩ භාර ගැනීම හා එසේ නොමැතිව ගෙවීම් නොකිරීම. තෝරාගත් සැපයුම්කරුවන් ප්‍රසිද්ධ කිරීම හා තෝරා නොගත් සැපයුම්කරුවන් වෙත එයට හේතු දක්වා යැවීම.<br>අභියාචනා කිරීමට අවස්ථාව ලබා දීම. | එලදායි | මාසික හා වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම් සකස් කිරීම.<br>ප්‍රසම්පාදනය අවසන්ව මාස 06 ක් තුල පසු පරීක්ෂාව අභ්‍යාන්තර විගණන සිදු කිරීම.<br>තාක්ෂණික පිරිවිතර පමණක් තාක්ෂණික කමිටුවට ඇගයීම සඳහා ලබා දීම. |
| 6 | වෙළෙඳපොළ මිල සැසඳුම් ක්‍රමයට ප්‍රසම්පාදනය කිරීමේදී එකම ආයතනයකින් වංචනික බිල්පත් ඉදිරිපත් කල හැකි වීම. | 3 | 4 | ලියාපදිංචි තැපැලෙන් ගෙන්වා ගැනීම. | මධ්‍යස්ථ | බිලෙහි සඳහන් වන ව්‍යාපාර ලියාපදිංචිය පරීක්ෂා කිරීම. |
| 18 | අමාත්‍යාංශය තුල තොග පවතීද යන්න තහවුරු කරගනිමින් තොරව නැවත භාණ්ඩ ඇණවුම් කිරීම | 2 | 4 | ගබඩා කළමනාකරණ දත්ත පද්ධතිය හරහා තොග අවම මට්ටමට පැමිණිපසු පමණක් ප්‍රසම්පාදන ඉල්ලීම් පද්ධතිය මගින් ස්වයංක්‍රියව ජනනය වීම. භාණ්ඩ මිලට ගැනිමට පෙර තොග පවතිද යන්න පරීක්ෂා කරගැනිම | එලදායි | වෙනත් අංශයකින් හෝ ගබඩාවෙන් ලබා ගත හැකි භාණ්ඩ පවතීද යන්න පරීක්ෂාවට මධ්‍යගත තොග පාලන ක්‍රමවේදයක් සකස් කිරීම. |

DRAFT